**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

# ලංසු ආරාධනය

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සඳහා පිරිසිදු කිරීමේ හා පවිත්‍රතා සේවා සැපයීමේ සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් අංකය (IFB): PS/03/PB/02/32/26**

1. **මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ** ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් බත්තරමුල්ල පිහිටි සුහුරුපාය ගොඩනැගිල්ලේ 14, 17, 18 හා 17 මහල් වල පිහිටි කාර්යාල පිරිසිදු කිරීමේ හා පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන්, යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (තනි අදියර තනි කවර ලංසු කැඳවීමේ පටිපාටිය) යටතේ සිදු කරනු ලබන අතර අරමුදල් සපයන මූලාශ්‍රය ශ්‍රී ලංකා රජයයි.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් හට වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරී, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, වෙතින් දුරකථන අංක : 0112 887697 / විද්‍යුත් ලිපිනය : mops.procurementunit@gmail.com මගින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී 2026.10.21 දින සිට 2026.11.10 වන දින දක්වා පැය 0900 සිට පැය 1500 අතර කාලයේ දී මූල්‍ය අංශය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල හිදී හෝ අපගේ නිල වෙබ් අඩවියෙන් (www.pubsec.gov.lk) ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කල හැකිය.

4. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරන ලද සියලුම ලංසුකරුවන්ට, අදාල භාණ්ඩ සැපයීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරු තම ආයතනය ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි කර තිබිය යුතු අතර, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකම රු. මිලියන 05 ට වැඩිනම් 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. මෙම ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් නොකිරීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් විය හැක. ලංසුකරුට ලැදියාවන් අතර ගැටුමක් නොතිබිය යුතු අතර ලංසුකරුගේ නම රජයේ අසාදු ලේඛනයේ සඳහන් නොවිය යුතුය. අමතර විස්තර ලංසු ලිපි ලේඛනවල සපයා ඇත.

5. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත්කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ලංසු ලිපි ලේඛන කට්ටලයක් රුපියල් හයදහස් දෙසියයක (රු. 6,200.00) ආපසු නොගෙවනු ලබන ලංසු පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් 2026.10.21 දින සිට 2026.11.10 වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි පැය 0900 සිට පැය 1500 දක්වා කාලය තුළ ලබාගත හැක. එක් ආයතනයක් සඳහා එක් ලංසුවකට එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.

6. මෙම ප්‍රසම්පානයට අදාළව ලංසු පිටපත් දෙකක් සහිතව (මුල් පිටපත / අනුපිටපත) 2026.11.11 දින පැය 14.00 ට හෝ ඊට පෙර 17 වන මහල, “සුහුරුපාය”, බත්තරමුල්ල ලිපිනයේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරනු ලබන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් කෙලවර ඉහළ අදාළ ප්‍රසම්පාදනයේ IFB අංකය පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී අදාල ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා සහභාගීවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් විසින් ලංසුකරුගේ ලිඛිත අවසරයක් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතුය. ලංසුකරුගේ ලිඛිත අවසරය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිදු නියෝජිතයෙකු ලංසු විවෘත කිරීම සඳහා සහභාගී කරනු නොලැබේ.

7. ඉදිරිපත් කරනු ලබන ලංසුවල වලංගු කාලය 2026.11.11 දින සිට 2027.01.27 දින දක්වා විය යුතුය.

8. සියලුම ලංසු, රුපියල් දෙලක්ෂ හැත්තෑ අට දහසක් (රු. 278,000.00) ක වටිනාකමින් හා 2027.02.24 දක්වා වලංගු කාලයෙන් යුත් ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.
   i. වාණිජ බැංකුවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ආයතනයක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.
   ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ ඇතුලත් පෝරමය පරිදි විය යුතුය.
   iii. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය “Secretary / Ministry of Public Security and Parliamentary Affairs ” නමින් විය යුතුය.

9. සේවා සැපයිය යුතු ස්ථානීය පරීක්ෂාව සඳහා 2026.10.28 දින පැය.09.00 සිට පැය 15.00 දක්වා හැකියාව ඇත.

10. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාලව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ හැකි අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුය.

11. <u>ලංසුකරුවන්ගේ විශේෂ අවධානයට</u>

ලංසු ලේඛන නිකුත් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පැමිණීමට ප්‍රථම mops.procurementunit@gmail.com විද්‍යුත් ලිපිනයට හෝ ෆැක්ස් අංක 0112887916 වෙත අවශ්‍ය ලංසු ලේඛන පිළිබඳ තොරතුරු යොමුකර පෙර දැනුම්දීමක් සිදුකර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

12. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදුකළ හැක.

| <u>ලිපිනය</u> | <u>දුරකථන අංක</u> |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරි, | සෘජු දුරකථන අංකය :- 011-2887697 |
| 17 වන මහල, “සුහුරුපාය”, | ෆැක්ස් අංකය :- 011-2887636/2887916 |
| බත්තරමුල්ල. | |

**සභාපති,**

**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,**

**17 වන මහල, “සුහුරුපාය”,**

**බත්තරමුල්ල.**

**2026.10.21**

**Democratic Socialist Republic of Sri Lanka**
**Ministry of Public Security and Parliamentary Affairs**

# INVITATION FOR BID (IFB)

**Procurement for the selection of a service provider to supply cleaning and sanitation services for the Ministry of Public Security and Parliamentary Affairs**

**Procurement No: PS/03/PB/02/32/26**

1. The Chairman of the Procurement Committee of the Ministry of Public Security and Parliamentary Affairs invites sealed bids from qualified suppliers for the provision of cleaning services to 14th, 17th, 18th and 19th Floors of the 'Suhurupaya' building complex in Battaramulla.

2. Bidding will be conducted under the National Competitive Bidding (NCB) method (single-stage, single-envelope procedure), and the source of funding is the Government of Sri Lanka.

3. Interested and qualified bidders may obtain further information from the Chief Accountant, Ministry of Public Security and Parliamentary Affairs (Tel: 0112 887697 / Email: mops.procurementunit@gmail.com). Additionally, the bidding documents may be inspected free of charge at the Finance Division, Ministry of Public Security and Parliamentary Affairs, 17th Floor, Suhurupaya, Battaramulla, on working days (excluding public and bank holidays) from 21.10.2026 to 10.11.2026 between 09:00 and 15:00 hours, or via our official website (www.pubsec.gov.lk).

4. All bidders meeting the qualification requirements must possess the legal right to supply the relevant goods. The bidder must have their organization registered as a business entity; furthermore, if the value of the submitted bid exceeds Rs. 5 million, the bidder must be registered under the Public Contracts Act No. 3 of 1987. Failure to submit this registration certificate along with the bid may result in the rejection of the bid. The bidder must not have a conflict of interest, and the bidder's name must not appear on the Government's blacklist. Additional details are provided in the bidding documents.

5. Interested bidders may obtain the set of bidding documents by submitting a written application and paying a non-refundable fee of Rs. 6,200.00 in cash to the address below, between 09:00 hours and 15:00 hours on government working days from 21.10.2026 to 10.11.2026. Only one bid document will be issued per bidder for a single bid.

6. Bids for this procurement, comprising two copies (original and duplicate), must be deposited in the bid box located at the Finance Division of the Ministry of Public Security and Parliamentary Affairs, 17th Floor, "Suhurupaya," Battaramulla, at or before 14:00 hours on 11.11.2026, or sent by registered post to the address below so as to be received prior to the bid opening time. The IFB number of the relevant procurement must be clearly marked on the top left corner of the envelope.

Late bids will be rejected. Furthermore, the relevant bids will be opened in the presence of bidders or their representatives who wish to attend in person. Representatives of bidders attending the bid opening must mandatorily produce written authorization from the bidder. Any representative who fails to present such written authorization will not be permitted to participate in the bid opening.

7. The validity period of the submitted bids shall be from 21.10.2026 to 27.01.2027.

8. All bids must be submitted with a bid bond valued at Rupees Two Hundred and seventy Eight Thousand (Rs. 278,000.00) and valid until 24.02.2027; the submitted bond must comply with the following conditions.

    i. It must be a guarantee obtained from an institution registered with the Central Bank of Sri Lanka as a commercial bank.
    ii. The Bid Security form shall be in accordance with the form included in the bidding document.
    iii. The bid bond must be issued in the name of "Secretary / Ministry of Public Security and Parliamentary Affairs".

9. On-site inspection for the provision of services can be conducted on 28.10.2026, between 9:00 hrs and 15.00 hrs.

10. The Procurement Committee may incorporate necessary amendments into each procurement process in accordance with periodically changing financial regulations and Treasury circular instructions, and the decision of the Ministry Procurement Committee shall be regarded as final.

11. To the attention of bidders:
    To avoid delays in the issuance of bid documents, you are kindly requested to provide advance notice regarding the required documents by emailing mops.procurementunit@gmail.com or faxing 0112887916 before your visit.

12. Further inquiries regarding this matter can be made via the following address or telephone numbers.

| Address | Telephone Numbers |
|---|---|
| Chief Accountant, | Direct Telephone Number : - 011-2887697 |
| 17th Floor, “Suhurupaya”, | Fax Number :- 011-2887636/2887916 |
| Battaramulla. | |

**Chairman,**
**Ministry Procurement Committee,**
**Ministry of Public Security and Parliamentary Affairs,**
**17th Floor, “Suhurupaya”,**
**Battaramulla.**
**21.10.2026**